ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

இலங்கை இறப்பர் ஆராய்ச்சி நிறுவனம்

# RUBBER RESEARCH INSTITUTE OF SRI LANKA




# 2021

Annual Report ஆண்டறிக்கை වාර්ෂික වාර්තාව

# ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
# ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත

## දැක්ම

රබර් කර්මාන්තය වෙත උසස් ගුණාත්මක භාවයෙන් යුත් විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම සපයා දෙන විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය බවට පත් වීම ආයතනයේ දැක්ම වේ.

## මෙහෙවර

ආර්ථික වශයෙන් ඵලදායක මෙන්ම පාරිසරික වශයෙන් හිතකාමී තිරසාර නවෝත්පාදන වැඩිදියුණු කිරීම මගින් ද, රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් නවතම තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ද රබර් කර්මාන්ත අංශයට පුනර්ජීවයක් ලබා දීම ආයතනයේ මෙහෙවර වේ.

## අරමුණු

- ජාතික ඵලදායිතාව අන්තර්ජාතික මට්ටමට උසස් කිරීම.
- ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි දේශීය ස්වභාවික රබර් නිෂ්පාදනය නඟා සිටුවීම.
- භූමිය, ශ්‍රමය හා අනෙකුත් සම්පත් ප්‍රශස්ත මට්ටමින් තිරසාරව භාවිත කිරීම.
- රබර් සඳහා දේශීය මට්ටමින් වටිනාකම් එකතු කිරීම උපරිම මට්ටමින් සිදු කිරීම.
- පුද්ගල නිපුණතා සංවර්ධනය මෙන්ම රබර් පර්යේෂණායතනයේ සේවක පිරිස්වල ස්වයං සංවර්ධනය දිරිගැන්වීම මගින් ආයතනයේ සංවිධානාත්මක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම.

## ප්‍රතිපත්ති

- රබර් නිෂ්පාදනය සහ පිරිසැකසීම සම්බන්ධ සෑම අංශයකම පර්යේෂණ හා ව්‍යාප්ති සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම.
- පරිසර හිතකාමී හා තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට හඳුන්වා දීම.

# අප ගැන

ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණවල මූලාරම්භය කළුතර දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන් කණ්ඩායමක් රබර් ක්ෂීරය කැටි ගැසීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා රසායනඥයකුගේ සේවය ලබා ගත් 1909 වසර දක්වා විහිදී යයි. 1913 වසරේදී රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීම සඳහා රබර් පර්යේෂණ සිදු කිරීම පසුකාලීනව තවදුරටත් ව්‍යාප්ත කරන ලද අතර 1951 දී මෙම ආයතනය ලංකා (වර්තමානයේ ශ්‍රී ලංකා) රබර් පර්යේෂණායතනය ලෙස හඳුන්වන ලදී. මේ අනුව, ලෝකයේ රබර් පිළිබඳව පෞරාණිකම පර්යේෂණායතනය බවට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය (RRISL) පත් ව තිබේ. පැළෑටි අභිජනනය, කෘෂිකාර්මික කළමනාකරණ පරිචයන් හා දළ රබර් රසායනය ආදී ක්ෂේත්‍රවලින් රබර් පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා ප්‍රෞඪ සේවාවක් සිදු කිරීම පිළිබඳව රබර් පර්යේෂණායතනය (RRISL) වාර්තා ගත වී තිබේ. රබර් කර්මාන්තයේ ප්‍රතිලාභය උදෙසා රබර් වගාවේ හා රබර් පිරිසැකසුම්කරණයේ සියළු අංශ පිළිබඳව පර්යේෂණ සිදු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යවස්ථාපිත පරිපාලන වගකීම පැවරී ඇති ශ්‍රී ලංකා නියෝජිතායතනය වන්නේ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයයි. බෝගයේ ජීව විද්‍යාව හා ස්වභාවික රබර්වල රසායනය හා නිෂ්පාදන තාක්ෂණය යන අංශ දෙකම සම්බන්ධයෙන් රබර් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා මෙම ආයතනය විශේෂීකරණය වී තිබේ. තවද, තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම් හා ව්‍යාප්ති නිලධාරීන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා සුදුසුකම් ලබාදීම සම්බන්ධයෙන් ද මෙම ආයතනය කැප වී කටයුතු කරයි. ඒ අනුව, මෙම පර්යේෂණාතයතනය සතුව ජෛව විද්‍යාත්මක පර්යේෂණ දෙපාර්තමේන්තු 5 ක් පවතී. ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රවේණි හා ශාක අභිජනනය, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා, පාංශු සහ ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තු හා ජෛව රසායන හා ශාක කායික විද්‍යා යන ජෛව විද්‍යාත්මක දෙපාර්තමේන්තු පහ ද, දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු, දළ රබර් හා රසායන විශ්ලේෂණ, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව හා දළ රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව යන රසායනික දෙපාර්තමේන්තු ද තාක්ෂණය හුවමාරු කිරීම් සඳහා වන උපදේශන සේවා දෙපාර්තමේන්තුව සහ උපයෝගිතා පර්යේෂණ, ජෛවමිතික, කෘෂි ආර්ථික, ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ හා පුස්තකාල යන ඒකකවලින් ද මෙම පර්යේෂණායතනය සමන්විත වේ.



# ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
# වාර්ෂික වාර්තාව 2021

## පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂතුමාගේ වාර්තාව | 1 |
| සංවිධාන ව්‍යුහය | 5 |
| ප්‍රධාන පෙළේ ජයග්‍රහණ | 6 |
| පර්යේෂණ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් | 10 |
| කළමනාකරණ මණ්ඩලය, කමිටු සහ කාර්ය මණ්ඩලය | 17 |
| මූල්‍ය ප්‍රකාශන | 30 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 62 |

## අධ්‍යක්ෂතුමාගේ වාර්තාව
## ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

ශ්‍රී ලංකාවේ සහ ගෝලීය වශයෙන් 2021 වර්ෂයේදී රබර් කර්මාන්තයේ පැවැත්ම සහ එම වසරේම ආයතනයේ ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන (R&D) ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් සැපයීම මෙම වාර්තාවේ අරමුණයි. එක් එක් අංශයේ පර්යේෂණ පිළිබඳ විස්තර වෙන වෙනම දක්වා ඇත. පර්යේෂණ සඳහා ඇති බාධා කෙටියෙන් දක්වා ඇත. එලෙසම ආයතනයේ පරිපාලන හා මූල්‍ය කටයුතුවල කාර්ය සාධනය ද සඳහන් වේ.

### ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය

*රබර් නිෂ්පාදනය සහ පරිභෝජනය*

2021 වර්ෂයේදී මෙරට ස්වභාවික රබර් (NR) නිෂ්පාදනය පෙර වසරට වඩා 0.5% කින්, ටොන් 76,884 දක්වා අඩුවී ඇත. 2021 වර්ෂයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සාමාන්‍ය කිරි කැපීමේ දින අඩුවීම මේ සඳහා බලපාන ලද ප්‍රධාන හේතුවකි. 2019 සහ 2020 අගයන් හා සසඳන විට 2021 වර්ෂය තුළ රබර් මිලෙහි මධ්‍යස්ථ දියුණුවක් දක්නට ලැබුණි. රටේ ස්වභාවික රබර් (NR) පරිභෝජනය තුන්වන කාර්තුව අවසානයේ ටොන් 98,300 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පෙර වසරේ එම කාලයට සාපේක්ෂව 14% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පශ්චාත් කොවිඩ්-19 රෝග සමයෙන් පසු ලෝක ආර්ථික තත්ත්වය වැඩිදියුණු වීම සහ ඵන්නත්කරණය ආධාරයෙන් බොහෝ කර්මාන්ත සාමාන්‍ය ධාරිතාවට ළඟා වී තිබීමයි.

*රබර් වගා ප්‍රමාණය*

2021 අවසන් වන විට මෙරට රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 138.8 දහසක් ලෙස වාර්තා වී ඇති අතර ඉන් 75-80% පමණ කිරි කැපීමට ලක්ව ඇත.

*ස්වභාවික රබර් ඵලදාවේ සාමාන්‍යය*

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික අස්වැන්න 2021 වර්ෂයේදී වසරකට/හෙක්ටයාරයට/කි.ග්‍රෑම් 679 ලෙස වාර්තා වී ඇති අතර 2020 වර්ෂයේදී එය 642 විය.

*ස්වභාවික රබර් අපනයනය*

2020 වර්ෂය සඳහාම ටොන් 15,766 ක ප්‍රමාණයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ශ්‍රී ලංකාව ස්වභාවික දළ රබර් ටොන් 15,490 ක් පමණ අපනයනය කර ඇත. මෙම පහලයාම රබර් පරිභෝජනය ඉහලයාම තුලින් පෙන්නුම් කලහැකි අතර මෙය, අගය එකතු කළ රබර් නිෂ්පාදන අංශයේ වර්ධනය සඳහා හොඳ දර්ශකයක් ලෙසද සැලකිය හැක. කෙසේ නමුත් 2020 වසරේදී ලබාදුන් රුපියල් බිලියන 5.6 සාපේක්ෂව 2021 වසරේදී දළ රබර් අපනයනයේ රුපියල් බිලියන 8.3 උපයා ඇත.

***රබර් නිෂ්පාදන අංශය***

නිමි භාණ්ඩ අපනයන ආදායම වර්ෂ 2021 දී රු. බිලියන 208 කි. මෙය පසුගිය දශකය තුළ මෙතෙක් වාර්තා වූ කැපී පෙනෙන දියුණුවක් සහ පෙර වසරට සාපේක්ෂව 43% ක පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි. අර්ධව සකසන ලද රබර් වල අපනයන ආදායම 2021 වර්ෂයේදී රුපියල් බිලියන 0.62 ක් ලෙස වාර්තා වී ඇති අතර, 2020 වසරේදී එය රුපියල් බිලියන 0.53 ක් විය. ඒ අනුව රබර් කර්මාන්තයෙන් ලැබෙන මුළු අපනයන ආදායම රු. බිලියන 216.92 වන අතර එය පෙර වසරට වඩා 43% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**ගෝලීය රබර් කර්මාන්තය පිළිබඳ සමාලෝචනය**

***ස්වභාවික රබර් සැපයුම***

සමස්ත ලෝකයේ ස්වභාවික රබර් (NR) නිෂ්පාදනය 2020 දී ටොන් 13,595 දහසක් වූ අතර එය 2021 දී ටොන් 13,882 දහසක් විය. ANRPC සංඛ්‍යාලේඛන වලට අනුව ලෝක ස්වභාවික රබර් (NR) නිෂ්පාදනය 2% කින් වැඩි වනු ඇතැයි ගණන් බලා ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වසර තුළ ආසියා පැසිෆික් කලාපයේ ප්‍රධාන වෙළඳපොලවල NR මිල වර්ධනය වීම් සහ Covid-19 වසංගතය හේතුවෙන් ඇති වූ බාධක ජය ගැනීමත් සමඟ රබර් වගා කරන ප්‍රධාන රටවල කිරි කැපීමේ තත්ත්වයන් සාමාන්‍ය මට්ටමට පත් වීමයි.

***ස්වභාවික රබර් සඳහා පවතින ගෝලීය ඉල්ලුම***

ANRPC ගණනය කිරීම්වලට අනුව ටොන් 12,953 දහසක් වූ 2020 වසරේ පැවති ඉල්ලුම 8% ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 2021 දී මුළු NR ඉල්ලුම ටොන් 14,076 දහසක් දක්වා ඉහළ යනු ඇත. මෙමගින් රබර්වල සැපයුම්-ඉල්ලුම පරතරය අඩුවීමක් පෙන්නුම් කළ අතර, එය අදාල කාලය තුළ NR ටොන් 194 දහසක් පමණ වේ.

***ලෝක ස්වභාවික රබර් මිල සංචලනය***

2011 වසරේ සිට 2018 වසර දක්වා බොහෝ වෙළඳපලවල පැවති පෙර මිල පහත වැටීමේ ප්‍රවණතාවය තිබුනද, 2019 සිට 2021 දක්වා කාලය සඳහා මිල ක්‍රමයෙන් වැඩි වීමක් අත්විඳින ලදී. 2021 වසර පුරාවටම ගෝලීය රබර් මිල තරමක් ඉහළ අගයක් ගන්නා ලදී. 2021 වසරේ ශ්‍රී ලංකාවේ RSS3 හි කිලෝග්‍රෑමයක මිල ඇමෙරිකානු ඩොලර් 2.20 ක් වූ අතර, එය 2020 වසරේදී ඇමෙරිකානු ඩොලර් 1.86 ක් ලෙස පැවතුණි. RSS3 හි සාමාන්‍ය මිල පසුගිය වසරේ සාමාන්‍ය අගය වූ ඇමෙරිකානු ඩොලර් 1.74 ට සාපේක්ෂව බැංකොක්හි ඇමෙරිකානු ඩොලර් 2.05 ක් ලෙස සටහන් විය. ඉන්දියානු RSS4 හි සාමාන්‍ය මිල පෙර වසරේ අගයට සාපේක්ෂව කිලෝග්‍රෑමයකට US$ 1.82 සිට US$ 2.27 දක්වා වැඩි වී ඇත. ANPRC රටවල පුරෝකථනයන්ට අනුව, ගෝලීය ආර්ථික ප්‍රකෘතිමත් වීම සහ ලෝකයේ ප්‍රධාන පාරිභෝගිකයන්ගේ ඉහළ ඉල්ලුම හේතුවෙන් ගෝලීය ස්වභාවික රබර් මිල වැඩි දියුණු වීමට ඉඩ ඇත.

***පර්යේෂණ සහ සංවර්ධන කටයුතු***

රබර් කර්මාන්තයේ හදිසි ගැටලු විසඳීම, දළ රබර් නිෂ්පාදන පිරිවැය අඩු කිරීම, රබර් ඉඩම්වල සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම, දළ රබර්වලට අගය එකතු කිරීම සහ රබර්වල පාරිසරික ප්‍රතිලාභ හඳුනා ගැනීම කෙරෙහි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් තුළින් අවධානය යොමු කරන ලදී. මුලින් 'Pestalotiopsis' ලෙස නම් කරන ලද නව පත්‍ර පතන රෝගය රබර් හෙක්ටයාර 20,000 කට පමණ බලපෑවේය. රෝගය පාලනය කිරීම සඳහා තාවකාලික නිර්දේශ නිකුත් කරන ලද අතර ඩ්‍රෝන තාක්‍ෂණය මේ සඳහා ක්ෂේත්‍රයේ යොදා ගැනීම් පරීක්ෂා කරන ලදී. ගස් අහිමි වීම මගින් අස්වැන්න තීරණය කරන ප්‍රධානතම සාධකයක් වූ සුදු මුල් රෝගය පාලනය කිරීම සඳහා ජෛව පළිබෝධනාශකයක් නිපදවන ලදී. රබර් වගාකරුවන් අතර දින හතරකට වරක් කිරි කැපීම ප්‍රවර්ධනය කරන අතරම, රබර් කිරි අස්වනු නෙලීමේ සේවක හිඟය සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සඳහා සතියකට වරක් කිරි කැපීමේ ක්‍රමයද පරීක්ෂා කරන ලදී. ඉහළ අස්වැන්නක් සහ රෝග ප්‍රතිරෝධයක් සඳහා අභිජනන වැඩසටහන අඛණ්ඩව කරගෙන යන අතරම වියළි දේශගුණයක් තුළ රබර් වගාව පහසු කිරීම සඳහා නියඟ ප්‍රතිරෝධය සඳහා ක්ලෝන පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී. එසේම, මෙම දේශගුණය යටතේ ක්ෂුද්‍ර වාරිමාර්ග භාවිතා කිරීමේ හැකියාව සොයා බලන ලදී. රබර්වල සමස්ත භූමි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මායිම් බෝගයක් ලෙස කුරුඳු වැවීම සහ අතුරු බෝග ලෙස පේර සහ අනෝදා වගා කිරීම පරීක්‍ෂා කරන ලදී. අගය එකතු කිරීම සඳහා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය වීම සඳහා සමහර මෝටර් රථ උපාංග සහ ජෛව වෛද්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට සුදුසු රබර් ආශ්‍රිත සංයෝග නිපදවන ලදී. STaRR ව්‍යාපෘතිය යටතේ මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්කවල රබර් වගා කර ඇති හෙක්ටයාර් 3,000 යොදා ගනිමින් සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාවට සහාය වීම සඳහා ස්වේච්ඡා කාබන් වෙළඳපොළ සඳහා ව්‍යාපෘති විස්තර ලේඛනයක් සකස් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය ජාත්‍යන්තර ප්‍රතීතනය ලත් කාබන් රෙජිස්ට්‍රි (VERRA) ලැයිස්තුගත කරන ලදී. ප්‍රධාන වශයෙන් ඉල්ලුම මත පදනම් ව පුහුණු වැඩමුළු සහ අනෙකුත් තාක්ෂණ හුවමාරු වැඩසටහන් පවත්වන ලදී. විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත රබර් සහ ඒ ආශ්‍රිත සංඝටක පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා දෙන ලදී. පරිමිත මූලද්‍රව්‍ය විශ්ලේෂණ සහ උත්තේජක මධ්‍යස්ථානයේ කාර්යයන් සහ ටයර් පරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම අඛණ්ඩව සිදු විය.

***පර්යේෂණ සඳහා පවතින බාධක***

සුදුසුකම් ලත් විද්‍යාඥයින් සහ ඒ ආශ්‍රිත කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පර්යේෂණ නිමැවුම් වලට බලපෑම් එල්ල විය. වැඩි වැටුප් පදනම්ව දේශීය විශ්වවිද්‍යාලවලට සම්බන්ධ වීමට සුදුසුකම් ලත් විද්‍යාඥයින් ආයතනය හැර යාමත් සමඟ රට තුළ බුද්ධි ගලනය දිගටම පැවතුනි. සියලුම වැවිලි භෝග පර්යේෂණ ආයතන ඒකාබද්ධ කොට විශ්වවිද්‍යාලයක් පිහිටුවීමෙන් මෙම ගැටලුව විසඳීමට ඉදිරිපත් කළ යෝජනාවේ ප්‍රගතියක් නොතිබිණ. මෙබැවින් විකල්ප ප්‍රවේශයක් අවශ්‍යය වේ. විද්‍යාඥයන් සහ සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සීමා කිරීම මත තත්ත්වය තවත් නරක අතට හැරුණි. ආයතනයේ වාහන සමූහයේ දුර්වල තත්ත්වය ක්ෂේත්‍ර පර්යේෂණ වැඩසටහන්වලට ද බලපෑම් ඇති කරන ලදී.

***පරිපාලන සහ මූල්‍ය කටයුතු***

පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වීම නිසා පරිපාලන කටයුතුවලට යම් ප්‍රමාදයක් සිදු තත්වයක පැවතිණ. කෙසේ වෙතත්, ආයතනයේ සමස්ත භෞතික හා මූල්‍ය කාර්ය සාධනය ඉලක්කවලට සාපේක්ෂව 90% කට වැඩි ප්‍රගතියක් පෙන්නුම් කරමින් සතුටුදායක විය. මෙය අමාත්‍යාංශයේ විශේෂ ඇගයීමට ලක් විය. ජාත්‍යන්තර සංචරණ සීමා පැනවීමත් සමඟ, භෞතිකව සිදු කරනු ලබන සේවකයින්ගේ මානව සංවර්ධන කටයුතු දේශීය වැඩසටහන්වලට පමණක් සීමා වූ අතර එවැනි වැඩසටහන් පහළොවක් සඳහා සේවකයින් හතළිස් හතක් සහභාගී විය. එසේ වුවද, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් කිහිපයකට සහභාගී විය.


***ඇගයීම***

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඵලදායීව ඉටු කිරීම සඳහා රබර් පර්යේෂණ මණ්ඩලය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ලබා දෙනු ලැබූ මූල්‍ය සහාය සහ මාර්ගෝපදේශකත්වය සහ උපදෙස් අතිශයින්ම අගය කරමි. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ඉටු කිරීමේද දී අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් ලබා දුන් සහාය ද ගෞරවයෙන් සිහිපත් කරමි. වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, විද්‍යාත්මක සහ විද්‍යාත්මක නොවන අංශවල සියලුම අංශ ප්‍රධානීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ලබා දෙන ලද දායකත්වය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරමි.
විශේෂයෙන්ම, මෙම සමාලෝචනය සඳහා අවශ්‍ය වන දත්ත ලබා දීම වෙනුවෙන් කෘෂි ආර්ථික ඒකකයට ද, අවශ්‍ය කරුණු සම්පාදනය කර 2021 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එළිදැක්වීම වෙනුවෙන් පුස්තකාල සහ ප්‍රකාශන ඒකකයේ කාර්යමණ්ඩලයට ද විශේෂ ස්තුතිය පුද කරමි.



ආචාර්ය වී.එච්.එල්. රොද්‍රිගෝ
වැඩබලන අධ්‍යක්ෂ

# සංවිධාන ව්‍යුහය


සභාපති/ රබර් පර්යේෂණ මණ්ඩලය
අභ්‍යන්තර විගණන ඒකකය
මණ්ඩල කාර්යාලය
වතු කළමනාකරණය පිළිබඳ උපදේශක කමිටුව
විගණන හා කළමනාකරණ කමිටුව
අධ්‍යක්ෂ / ප්‍ර.වි.නි.
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ)
දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව
රබර් තාක්ෂණික හා සංවර්ධන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය (රත්මලාන)
බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව
දළ රබර් සැකසුම් සංව. හා රසා. ඉං. දෙපාර්තමේන්තුව
ඉලෙක්ට්‍රොනික අලුත්වැඩියා ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව)
ප්‍රවේනි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව
ශාක විද්‍යා දෙපාර්තමේන්තුව
ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව
පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව
ජෛව රසායන හා ශාක කායික විද්‍යා දෙපාර්තමේන්තුව
උපදේශක සේවා දෙපාර්තමේන්තුව
උපයෝගිතා පර්යේෂණ ඒකකය
ජෛවමිතික අංශය
කෘෂි ආර්ථික විද්‍යා ඒකකය
ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
පාලන දෙපාර්තමේන්තුව
ගිණුම් අංශය
වැඩ අංශය
අධ්‍යක්ෂ කාර්යාලය
වතු දෙපාර්තමේන්තුව
උප මධ්‍යස්ථාන
පුස්තකාලය
මොණරාගල
පොල්ගහවෙල
කුරුවිට

## 2021 වර්ෂය තුළ ලබා ගත් ප්‍රධාන ජයග්‍රහණ

- සුදුමුල් රෝගයට එරෙහිව ක්‍රියා කරන ජෛව පළිබෝධනාශක 2 ක් ලියාපදිංචිය සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කිරීම



කොම්පෝස්ට් පදනම් කරගත් ජෛව පළිබෝධනාශක නිෂ්පාදනය

- වාහන වල ද්‍රව්‍ය භාවිතා කරන තිරිංග පෑඩ් (break pads), බ්‍රේක් වොෂර් (break washers) සහ කේබල් ගයිඩ් (cable guides) සුදුසු රබර් සංයෝග මඟින් නිෂ්පාදනයට මඟ පෙන්වීම මෙන්ම ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ජෛව වෛද්‍ය නිෂ්පාදන වල අමතර කොටස් සඳහා සුදුසු රබර් සංයෝග මධ්‍ය පරිමාණ රබර් නිෂ්පාදන සමාගම්වල ඉල්ලීම පරිදි සිදුවීම.



රබර් සංයෝග භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද මෝටර් රථ අමතර කොටස් (automobile components)

- කොම්පෝස්ට් පොහොර භාවිතයට අදාලව ගොවි සහභාගීත්ව පර්යේෂණ අත්හදා බැලීම් ඒකක 64 ක් අක්කර 131.8 ක භූමි ප්‍රමාණයක් තුල ස්ථාපිත කරන ලදී. කලුතර, කුරුණෑගල, නුවර/මාතලේ, කෑගල්ල, මාතර, ගාල්ල, කොළඹ, රත්නපුර,
  පරිනත ඉඩම්- 27 (අක්කර 68)
  අපරිනත ඉඩම්-37 (අක්කර 63.8)



කාබනික පොහොර යෙදීමට අදාල ආදර්ශන- කලුතර දිස්ත්‍රික්කය

- කලුතර දිස්ත්‍රික්කය තුල කුඩා රබර් ඉඩම් හිමියන්ගේ තෝරාගත් ඉඩම් වල තෘණ වගාව හඳුන්වා දීම හා ස්ථාපනය. මෙහි අරමුණ වන්නේ අමතර ආදායමක් හඳුන්වාදීම තුලින් කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම වේ. අක්කර 12 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘතිය සඳහා ගොවීන් 14 දෙනෙකු සහභාගී විය.



තෘණ අස්වනු නෙලීම - කලුතර දිස්ත්‍රික්කය

- රබර් වගාවන් හී මායිම් බෝගයක් ලෙස කුරුඳු වගාව ප්‍රචලිත කිරීම පර්යේෂණ මගින් රබර් ශාකවලට හෝ රබර් කිරි අස්වැන්න කෙරෙහි බලපෑමක් නොවන බව හඳුනා ගන්නා ලදි.



(a) (b) (c)

මායිම් බෝගයක් ලෙස කුරුඳු වගා කර තිබීම (a) කුරුඳු පැළ පැල කිරිමේදී (b) කුරුඳු සිටුවා වසරකට පසු (c) කුරුඳු සිටුවා වසර දෙකකට පසු

- ස්වාභාවික මිනිරන් භාවිතා කරමින් ග්‍රැෆීන් ඔක්සයිඩ් (graphite oxide) සාර්ථකව සංස්ලේෂණය කරන ලද අතර, ඒය නැනෝ ග්‍රැෆීන් සංස්ලේෂණයේ අතරමැදි ද්‍රව්‍ය වන අතර ඒය ඉලෙක්ට්‍රොනික උපාංග නිෂ්පාදය සඳහා යොදා ගැනේ.



ග්‍රැෆීන් ඔක්සයිඩ්

ග්‍රැෆීන්

ග්‍රැෆීන් ඔක්සයිඩ් සංශ්ලේෂණය

- රබර් සමග අතුරු වගාවන් ලෙස පේර සහ කටු අනෝදා වගා කිරීමේ මොඩල ඉදිරිපත් කිරීම.



(a) (b)

රබර් සමග පළතුරු පැළ වගා කිරීම (a) පේර සහ (b) කටු අනෝදා යොදා සිදුකර ඇති මොනරාගල පිහිටි පර්යේෂණ වගාවන්

- රබර් ශාකයේ සාර්ථක ක්ෂේත්‍රගත කිරීමක් උදෙසා පරිසර හිතකාමී ආර්ථික වශයෙන් සහනදායී සෙමින් පෝෂක මුදා හැරීමේ පොහොර තාක්ෂණය ප්‍රධාන වැවිලි සමාගම් වන පුස්සැල්ලාව, කැළණිවැලි, කෑගල්ල යටතේ වූ වතු 14 ක් තුළ සහ කුඩා රබර් වතු හිමියන් ආශ්‍රිත ස්ථාන 6 ක් තුළ ස්ථාපනය කිරීම.





සිදුරුමය පොහොර නළ පිළියෙල කිරීම සහ ඒවා ක්ෂේත්‍රගත කිරීම.

- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ස්ථාපනය කරන ලද හෙක්ටෙයාර 3000 ක නව රබර් වගාව මගින් තිර කරනු ලබන කාබන්, ස්වේච්ඡා කාබන් වෙළඳපොළ වෙත යොමු කිරීමේ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති විස්තරය (Project Description Document) සාදා නිම කර එය අන්තර්ජාතික ප්‍රතීතිත ලේඛනයක (VERRA Registry) ලැයිස්තු ගත කිරීම.

# පර්යේෂණ දෙපාර්තමේන්තුවල විශේෂ ක්‍රියාකාරකම් - 2021

## ශස්‍ය විද්‍යා දෙපාර්තමේන්තු/අංශ/ඒකක

### ප්‍රවේණි සහ ශාක අභිජනන දෙපාර්තමේන්තුව

- *Hevea* germplasm එකතුව ප්‍රවේණික පරාමිතීන් අනුව වර්ගීකරණය කිරීම සහ අනාගත අභිජනන වැඩසටහන සඳහා සුදුසු ප්‍රවේණි වර්ග හඳුනාගැනීම සඳහා අණුක සලකුණු භාවිතා කිරීම ඇගයීම.
- ඉන්දියාව, මියන්මාරය, තායිලන්තය සහ අයිවරි කෝස්ට් වෙතින් ක්ලෝන 17 ක් ලැබුණි. ඒවා දේශීය පරිසර තත්ව වලට අනුවර්තනය වීම සහ කාර්ය සාධනය (අස්වනු සහ වර්ධන විභවයන් හා ලෙඩරෝග ගැන) පරීක්ෂා කිරීම අරඹන ලදී.
- තෝරාගත් Hevea ක්ලෝන වල නියඟයට ඔරොත්තු දීම පරීක්ෂා කිරීම සඳහා, තෝරාගත් ජානවල ප්‍රමාණාත්මක ජාන ප්‍රකාශන විශ්ලේෂණය සිදු කරන ලදී. RRISL 2005 සහ RRISL 2006 ක්ලෝන RRISL 203, RRIC121, RRISL Centennial 3 සහ RRISL 2100 හා සසඳන විට නියඟයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි වන අතර ප්‍රතිඵල තහවුරු කිරීම සඳහා වැඩිදුර පර්යේෂණ දිගටම කරගෙන යනු ලැබේ.

### ශාක විද්‍යා දෙපාර්තමේන්තුව

- ළපටි බද්ධ පැළ තවාන්හී බීජ ප්‍රමාණ භාවිතය, පැළවීමේ සීඝ්‍රතාවය සහ තවාන් පේළි ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදුකර ගෙන යනු ලැබේ. සම්ප්‍රදායික නොවන ප්‍රදේශ සඳහා භාවිතා කළ හැකි රෝපණ ද්‍රව්‍ය හඳුනාගැනීමේ පර්යේෂණ වල ප්‍රගතිය සැසඳීම සඳහා වර්ධන හා කායික විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම සිදු කරනු ලබයි.
- මොනරාගල දිස්ත්‍රික්කයේ නව රබර් වගා බිම් දෙකක් ආශ්‍රයෙන් ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමයක් ලෙස සවිවර නල භාවිතා කිරීමේ හැකියාව අධ්‍යයනය කරන අතර, එමගින් වියළි කාලතරණ සඳහා අඩු ජල පරිමාවක් භාවිතා කිරීමේ හැකියාව සොයා බලනු ලබයි. තවද, මෙමගින් වගාවන්හී පැළ සංඛ්‍යාව ඉහළ අගයක පවත්වා ගත හැකි දැයිද පරීක්ෂාවට ලක් කෙරේ.
- මොනරාගල, අම්පාර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල රබර් සමග අතුරුබෝග වගාවන් ලෙස හෙක්ටයාර හතකට වඩා වැඩි ප්‍රමාණයක් නව රබර් වගා ලෙස ආරම්භ කරන ලදී.
- රබර් සමග කුරුඳු අතුරුබෝග වගා ක්‍රම කිහිපයක් පිළිබඳ නව අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට යෝජිත නව රජයේ රබර් පැළ තවාන සඳහා ඉඩම සකස් කිරීම, ජල සම්පාදනය, බද්ධ අතු තවාන් හා බීජ පැළ තවාන් පිළිබඳ තාක්ෂණික වාර්තා ලබා දෙන ලදී.
- බද්ධ පැළ තවාන් හී රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම හා දුර්වල පැළ, තවාන් වලින් ඉවත් කිරීමේ තවාන් පරීක්ෂාවන් නොකඩවා සිදු කරමින් රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට කටයුතු සලසන ලදී.

- රබර් සම්බන්ධ වගා ක්‍රම පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශන තුනක් මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා රබර් ගොවීන් සහභාගිත්වයෙන් සිදු කරන ලදි. කිරි කැපීමේ පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් මොනරාගල දිස්ත්‍රික්කයේ සිදු කරන ලදි.

### ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව

- සුදුමුල් රෝගයට එරෙහිව ක්‍රියා කරන වැඩි දියුණු කරන ලද ජෛව පළිබෝධනාශක ලියාපදිංචිය සඳහා පළිබෝධනාශක රෙජිස්ටාර් කාර්යාලය වෙත යොමු කරන ලදී.
- රබර් වගාවේ පැතිරෙමින් පවතින වලයාකාර පත්‍ර පුල්ලි රෝගය (නව පත්‍ර පතන රෝගය) පාලනයට ඩ්‍රෝන තාක්ෂණය භාවිතය පිළිබඳව මූලික අත්හදා බැලීම් සිදු කරන ලදි.

### පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව

- පරිසර හිතකාමී සහ ආර්ථිකමය වාසිදායක සෙමින් පෝෂක මුදා හැරීමේ තාක්ෂණය වතු ක්ෂේත්‍රයේ හා කුඩා රබර් හිමියන් තුළ පිළිවෙලින් හෙක්ටයාර් 50 සහ 12 තුළ ස්ථාපනය කරන ලදී.
- රසායනාගාර ප්‍රතීතනය ISO 17025 ලබා ගැනීම උදෙසා විශ්ලේෂණ ක්‍රියාවලීන් 6 සඳහා වූ ලේඛනගත කිරීම් පිළියෙල කරන ලදී.
- පත්‍ර සාම්පල දත්තයන්ට අනුව අපරිණත රබර් වගාවේ නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් වල ඌණතාවන් ඇති බවත් පරිණත වගාවේ මැග්නීසියම් පෝෂකයේ ඌණතාවන් ඇති බවත් හඳුනා ගන්නා ලදී.
- කාබනික වගාව ප්‍රවර්ධනය පිණිස කුඩා පොත් පිංචක් පිළියෙල කරන ලදී.
- අකාබනික පොහොර පමණක් යෙදීමට සාපේක්ෂව රබර් අපසන්දන ජලය යොදා ගනිමින් හරිතාගාර තත්වයන් යටතේ වගා කරන ලද සලාද පිපිඤ්ඤා ශාකයන්හි සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම නිරීක්ෂණය කරන ලදී.
- Pesta රෝගය සඳහා පෝෂක කළමණාකරනයන්හි බලපෑම නිරීක්ෂණය පිළිබඳව කරන ලද පරීක්ෂණ නැවතත් අධ්‍යනය කරන ලදී.
- ක්ෂේත්‍ර විශේෂිත පෝෂණ කළමණාකරණ කලාප රබර් වගා කරන ප්‍රදේශ තුළ හඳුනා ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි පාංශු පරාමිතීන්ගේ ක්ෂේත්‍ර විචල්‍යතාවය යොදා ගන්නා ලදී.
- රබර් වගා කිරීම පිණිස සුදුසු ඉඩම් හඳුනා ගැනීම යටතේ ක්ෂේත්‍ර යෝග්‍යතා වාර්තා 3 ක් නිකුත් කරන ලදී.

### ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව

- නිෂ්පාදන වියදම අඩු කිරීම සහ කැපුම් කරුවන්ගේ හිඟයට පිළියමක් ලෙස S/2 d4 අඩු තීව්‍රතා කැපුම් ක්‍රමය වතු සහ කුඩා රබර් ඉඩම් හිමියන්ට අයත් 1500ha පමණ ස්ථාපනය කරන ලදී.

**උපදේශක සේවා දෙපාර්තමේන්තුව**

- රබර් ඉඩම් 121 ක් ආදර්ශ ආදර්ශ වගාවක් ලෙස සංවර්ධනය කරන ලදී.( අපරිනත - 56, පරිනත - 65)
- කාබනික පොහොර භාවිතයට අදාළව ගොවි සහභාගිත්ව පර්යේෂණ අත්හදා බැලීම් ඒකක 40 ක් ස්ථාපිත කරන ලදී.
- රබර් සැකසුම් මධ්‍යස්ථාන 26 ක් , ආදර්ශ රබර් සැකසුම් මධ්‍යස්ථාන ලෙස වැඩි දියුණු කරන ලද අතර තව දුම් ගැසූ දාර රබර් සැකසුම් මධ්‍යස්ථාන 21 ක් ඉදිකරන ලදී. අපේක්ෂිත මට්ටමට නිශ්පාදන කටයුතු සිදු නොවන දුම් ගැසූ දාර රබර් සැකසුම් මධ්‍යස්ථාන 7 ක් පුනරුත්තාපන කිරීමේ කටයුතු සිදු කරන ලදී.
- රබර් ඉඩම් 66 ක් වැහි ආවරණ ආදර්ශන ලෙස සකස් කරන ලදී.
- රබර් ඉඩම් 08 ක් අතුරු භෝග ආදර්ශන ලෙස වැඩි දියුණු කරන ලදී.
- රබර් කිරි කපන්නන්ගේ හිඟයට විසඳුමක් ලෙස කිරි අස්වනු නෙළීම පුහුණු කිරීමේ පාසල් හරහා නව කිරි අස්වනු නෙළීමේ සහයකයින් 54 දෙනෙකු වතු ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.
- සමාන්‍ය රබර් වගාව සහ රබර් වෙළඳපොළ පිළිබඳ රබර් වගාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 36 ක් පැවැත් වූ අතර එමඟින් කුඩා රබර් ඉඩම් හිමියන් හා වතු අංශයෙහි සේවකයින් 900 දෙනෙකු පුහුණු කරන ලදී.
- කුඩා පරිමාණ රබර් වගාකරුවන්ගේ සහ වතු අංශයෙහි ඉල්ලීම් මත තාක්ෂණය උපයෝගී කර ගැනීමේ දී ක්ෂේත්‍ර මට්ටමේන් ඇතිවන ගැටළු සහ අනෙකුත් විශේෂිත ගැටළු විසඳීම සඳහා ක්ෂේත්‍රයට ගොස් අවශ්‍ය උපදේශක සේවාවන් 275 ක් සම්පූර්ණ කරන ලදී.එනම් අපරිනත වගා ආශ්‍රිත ගැටළු 35 ක් ද පරිනත වගාව ආශ්‍රිත ගැටළු 205 ක් හා දුම් ගෙවල් - 35 වශයෙනි.

**ජෛවමිතික අංශය**

- රබර් අංශයේ පර්යේෂණ සඳහා වඩා හොඳ සේවාවක් සැපයීමේ අරමුණින් එම අංශයේ අවශ්‍යතා වලට සරිලන පරිදි ජෛවමිතික අංශයේ පර්යේෂණ වැඩසටහන තුළ වඩාත් සුදුසු නිවැරදි සංඛ්‍යානමය ක්‍රමවේද හඳුනා ගැනීමට ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී.
- පර්යේෂණවල අර්ථකථනය වැඩිදියුණු කිරීම සඳහා රබර් අංශයේ සමාජ-ආර්ථික දත්ත සඳහා නව සංඛ්‍යානමය ක්‍රමවේද යොදාගන්නා ලදී.
- කෑගල්ල ප්‍රාදේශීය උපදේශක කාර්යාල පරිශ්‍රයේ නව ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලද අතර දත්ත ලබා ගැනීම ලබන වසරේ සිට ආරම්භ කෙරේ.
- රබර් අංශයේ GIS යෙදුම් සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි සහ පර්යේෂණ සංවිධානය සහ එක්සත් රාජධානියේ සැල්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලය සමඟ අන්තර් ආයතනික සහයෝගිතා ආරම්භ කර ඇත.

**උපයෝගීතා පර්යේෂණ ඒකකය**

- වියළි කලාපීය ප්‍රදේශයන් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම සහ නාච්චදූව ප්‍රදේශ වල රබර් වගාව පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ශක්‍යතා අධ්‍යන සිදු කරන ලදී.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාච්චදූව ප්‍රදේශයේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රදේශයේ ගොවි සහභාගිත්ව උපයෝගිතා පර්යේෂණ නියැදි ස්ථාපනය කරන ලදී.
- රබර් පර්යේෂණායතනය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ තුරුසවිය අරමුදල යන රබර් ආශ්‍රිත රාජ්‍ය ආයතනයන්හි කාබන් පියසටහන් ගණනය කරන ලදී.
- රබර් ආශ්‍රිත රාජ්‍ය ආයතනයන්හි ඉහළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා, 'දේශගුණික විපර්යාසයන් කෙරෙහි රබර් වගාවේ කාර්යභාරය කාබන් පියසටහන සහ කාබන් වෙළපොල' පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්ක වල නව රබර් වගාව මගින් තිර කරනු ලබන කාබන්, ස්වේච්ඡා කාබන් වෙළඳපොළ වෙත යොමු කිරීමේ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති විස්තරය (Project Description Document) සාදා නිම කරන ලද අතර එය අන්තර්ජාතික ප්‍රතීතිත ලේඛනයක (VERRA Registry) ලැයිස්තු ගත කරන ලදී.

**කෘෂි ආර්ථික විද්‍යා අංශය**

- රබර් ආශ්‍රිත කෘෂි වන වගා කටයුතු වල නිරත ගොවීන්ගේ සමාජ ආර්ථික ලක්‍ෂණ මත පදනම්ව ඔවුන්ගේ ගොවිපල වර්ගීකරණය කිරීම අවසන් කල ද රබර් ආශිත කෘෂි වන වගා ක්‍රම වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමේදී එම වගා ක්‍රමවල විෂම ස්වභාවය සලකා බැලීම සිදුකල යුතු වේ.
- මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් ආශිත කෘෂි වන වගා කටයුතු වල නිරත ගොවි පවුල්වල ජීවනෝපාය ප්‍රාග්ධන දර්ශක (Livelihood capital indicators) විශ්ලේෂණය කරන ලද අතර රබර් ආශ්‍රිත කෘෂි වන වගා වල නියුක්ත ගොවීන්ගේ ජීවනෝපාය සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ එමගින් යෝජනා කර ඇත.
- රබර් කර්මාන්තය නැවත කඩාවැටීම වළක්වා ගැනීම සඳහා, රබර් කර්මාන්තයේ ඓතිහාසික දත්තවල වෙනස්වීම් ලක්ෂ්‍යයන් විශ්ලේෂණය කරමින් ප්‍රධාන පියවර කිහිපයක් යෝජනා කරන ලදී.
- කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් කුඩා වතු හිමියන්ගේ සමාජ-ආර්ථික ලක්ෂණ විශ්ලේෂණය තුලින් ඔවුන් නැවත රබර් වගා කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බලපාන ප්‍රධාන කරුණු විශ්ලේෂණය කරන ලදී. රබර් ගොවිතැනින් හැර ලැබෙන අනෙකුත් ආදායම්, සහනාධාර, ගෘහ මූලිකයාගේ අධ්‍යාපනය, පවුල් ශ්‍රමය වගා කටයුතු සඳහා යෙදවීම සහ වගා හිමියා ගොවි සමිති සඳහා සහභාගීත්වය යන කරුණු රබර් ගොවීන් රබර් වගාවේ රැඳී සිටීමට බලපාන ප්‍රධාන සාධක වේ.

**පුස්තකාලය හා ප්‍රකාශන ඒකකය**

- ආයතනික ප්‍රකාශන එනම්, Handbook of Rubber Vol 1- Agronomy, RRISL Journal වෙළුම 97(2017), 98(2018), 99(2019), 100(2020), RRISL බුලටින් වෙළුම 54(2017), 55(2018), රබර් පුවත් වෙළුම 29(2020), 30(2020), 31(2021), 32(2021), 33(2021), වාර්ෂික වාර්තාව 2020 සහ උපදෙස් පත්‍රිකා පිටපත් 4500 ක් (Establishment of Rubber in Dry Climates - සිංහල සහ ඉංග්‍රීසි) සකස් කරන ලදී.

**ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය**

- ඩාර්ටන්ෆිල්ඩ් සහ රත්මලාන කාර්යාල පරිශ්‍රයන් වල මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කරන ලදී. ඒ අනුව, හෝන් වර්ගයේ ස්පීකර් හත (07) ක්, බිත්ති මත සවිකරන වර්ගයේ ස්පීකර් තිස් හත (37) ක් සහ සීවිලිම මත සවිකරන වර්ගයේ ස්පීකර් හත (07) ක් අවශ්‍ය ස්ථානවල ස්ථාපනය කර වින්‍යාස කරන ලදී.
- ඩාර්ටන්ෆිල්ඩ් කාර්යාලයේ අන්තර්ජාල සම්බන්ධතාවය ස්ථාවර, බාධාවලින් තොර අධිවේගී ප්‍රකාශ තන්තු (ෆයිබර් ඔප්ටික්) ලීස් ලයින් සම්බන්ධතාවයක් හරහා වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ අවශ්‍ය පියවර ගන්නා ලදී.
- ආයතනික නිල වෙබ් අඩවිය (www.rrisl.gov.lk) යාවත්කාලීන කිරීමේ කටයුතු වසර මුළුල්ලේම සිදු කරන ලදී.
- නිවිතිගල කැලේ උප මධ්‍යස්ථානයේ අන්තර්ජාල සම්බන්ධතාවය වඩාත් ස්ථාවර, බාධා වලින් තොර සහ අධිවේගී අන්තර්ජාල දත්ත වේගයක් සහිත දෘශ්‍ය තන්තු සම්බන්ධතාවයක් හරහා වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ මූලික පියවර ගන්නා ලදී.

## රබර් තාක්ෂණ දෙපාර්තමේන්තු

**රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව**

- කජු ලෙලි දියරය ප්‍රතිඔක්සිකාරකයක් ලෙස යොදා ගනිමින් සිලිකා පිරවූ ටයර් සංයෝග නිපදවන ලදී.
- වාත්තු භාණ්ඩ නිපදවන කර්මාන්තකරුවකුගේ සහයෝගීතාවයෙන් රබර් කිරි ආශ්‍රිත මාළු ඇමක් නිපදවන ලදී.
- ව්‍යවසායකුගේ ඉල්ලීම පරිදි ස්වාභාවික රබර් ආශ්‍රිත ක්ෂුද්‍ර සෛලීය තුනී ෂීටයක් නිපදවන ලදී.
- මධ්‍ය පරිමාණ ව්‍යවසායකුගේ ඉල්ලීම පරිදි බ්‍රේක් වොෂර් සෑදීම සඳහා රබර් සංයෝගයක් නිපදවන ලදී.
- ඉවතලන ඔයිල් පාම් (oil palm) අපද්‍රව්‍ය වලින් සංස්ලේෂණය කරන ලද නැනෝ තන්තු යොදා ගනිමින් රබර් සංයෝග නිපදවන ලදී.

- මධ්‍ය පරිමාණ ව්‍යවසායකුගේ ඉල්ලීම පරිදි මෝටර් බයිසිකල්වල කේබල් ගයිඩ් (cable guide) සඳහා රබර් සංයෝගයක් නිපදවන ලදී.
- මධ්‍ය පරිමාණ ව්‍යවසායකුගේ ඉල්ලීම පරිදි ජෛව-වෛද්‍ය අයිතමයක අමතර කොටසක් සඳහා රබර් සංයෝගයක් නිපදවන ලදී.
- කුඩා පරිමාණ ව්‍යවසායකුගේ ඉල්ලීම පරිදි බයිසිකල්වල තිරිංග පෑඩ් (brake pads) සඳහා රබර් සංයෝගයක් නිපදවන ලදී.
- පාවහන් නිෂ්පාදනකරුවකුගේ ඉල්ලීම පරිදි පාවහන් වල පිටත අඩියට සුදුසු ස්වාභාවික රබර් ආශ්‍රිත සංයෝගයක් නිපදවන ලදී.
- ව්‍යවසායකයින්/කර්මාන්තවල නියැලී සිටින පුද්ගලයින් තිස් දෙනෙකු සඳහා "රබර් භාණ්ඩ නිෂ්පාදනය" සම්බන්ධයෙන් පුහුණුව ලබා දෙන ලදී.

**බහු අවයවික රසායනික දෙපාර්තමේන්තුව**

- දැනට රබර් සංයෝග සෑදීම සඳහා යොදා ගන්නා නයිට්‍රොසෝඇමීන විමෝචනය කරන ත්වාරක (රසායනික ද්‍රව්‍ය) වෙනුවට යොදා ගත හැකි පරිසර හිතකාමී නයිට්‍රොසෝඇමීන විමෝචනය නොවන නව ත්වාරක පද්ධති වල බලපෑම අධ්‍යනය කරන ලදී.

**දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව**

- සාන්ද්‍ර රබර් කිරි නිෂ්පාදනයේදී යොදන ඩයි ඇමෝනියම් හයිඩ්‍රජන් ෆොස්ෆේට් (DAHP) රසායන ද්‍රව්‍ය රබර් කිරි තුළ වැඩිපුර එකතුවීමෙන් රබර් පටලවල ගුණාත්මකභාවය කෙරෙහි ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරන ලදි. එමඟින් ලද ප්‍රතිඵල ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද පස්වන අන්තර්ජාතික පර්යේෂණ ප්‍රතිඵල එළිදැක්වීමේ සම්මන්ත්‍රණයේදි ප්‍රකාශයට පත් කරන ලදි.
- ප්‍රතිචක්‍රීකරණය ලද කාබන් බ්ලැක් නැවත රබර් කර්මාන්තයට යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා රුහුණු විශ්ව විද්‍යාලය සමග එකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කරන ලදි.

**දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

- ෂීට් රබර් හා ක්‍රේප් රබර් නිෂ්පාදන කර්මාන්ත තුල ජනනය වන අප ජලය රසායනිකව ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය තුළින් පහත දේ හඳුනාගෙන ඇත.
    - ක්‍රේප් රබර් සැකසුම්කරණයේදී තුන්වන ඇඹරීමෙන් පසුව ජනනය වන අප ජලය, සරළ පූර්ව ප්‍රතිකාරයකින් පසුව පසට බැහැර කිරීම.
    - ක්‍රේප් රබර් සැකසීමේදී අනවශ්‍ය ලෙස අධිකව ඇඹරුම් ජලය භාවිතය වැළැක්වීම සඳහා ඇඹරුම් ජලය ප්‍රශස්තව යොදා ගැනීම.
    - RSS නිෂ්පාදන ක්‍රියාවලියේ කැටි ගැසීම හා ඇඹරුම් අවස්ථා වලින් ජනනය වන අප ජලයේ සැළකිය යුතු වෙනසක් නොමැති බැවින් වෙන් කිරීමට අවශ්‍යතාවයක් නොමැති බව.

- කේන්ද්‍රපසාරී රබර් කිරි නිෂ්පාදන කර්මාන්තයේදී ජනනය වන්නා වූ ගුණාත්මක බවින් අඩු අතුරු ඵලයක් වන Skim rubber මත අගය එකතු කොට Thermoplastic rubber සැකසීම සඳහා යොදා ගන්නා ලදී.
- තෝරාගත් විවිධ ගුණාත්මක තත්වයෙන් යුතු කාබන් බ්ලැක් යොදා රබර් සංයෝග සකසා ඒවායේ භෞතික හා යාන්ත්‍රික ගුණ අධ්‍යනය කොට ප්‍රකාශයට පත් කරන ලදී.
- රබර් කර්මාන්තශාලා ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

**මොණරාගල උප මධ්‍යස්ථානය**

- මෑ කරල්, මුං ඇට, කව්පි, බණ්ඩක්කා, බටු, අමු මිරිස්, සහ මඤ්ඤොක්කා ඇතුළත් බෝග සහිත ආදර්ශන ක්ෂේත්‍ර නඩත්තු කරන ලදී.
- කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීම සඳහා කාබනික පොහොර ටොන් 05 ක් උප මධ්‍යස්ථානයේ භාවිතය සඳහා නිෂ්පාදනය කරන ලදී.

# කළමනාකරණ මණ්ඩලය, කමිටු සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

### කළමනාකරණ මණ්ඩලය

*ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයෝ*

1. මහාචාර්ය සුධීරා එම්.ඩබ්. රන්වල මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2. කේ.වී.ඩී.සී. විමලසිරි මයා, අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
3. දර්ශනී ද සිල්වා මිය, අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
4. ආචාර්ය එල්.එම්.කේ. තිලකරත්න මයා, උපදේශක (රබර්), එක්සත් ජාතීන්ගේ සංවිධානය
5. ජස්ටින් සෙනෙවිරත්න මයා, අධ්‍යක්ෂ, ලලාන් රබර් පුද්ගලික සමාගම
6. අනුෂ පෙරේරා මයා, වැවිලි උපදේශක, බලංගොඩ වැවිලි සමාගම (2021.11.15 දින දක්වා
7. උදාර ප්‍රේමතිලක මයා, අධ්‍යක්ෂ වැවිලි (රබර්), කැළණි වැලි වැවිලි සමාගම
8. මහාචාර්ය ගාමිණී සේනානායක මයා, සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
9. ආචාර්ය කාංචන සිල්වා මයා, අධ්‍යක්ෂ, තුරුසවිය අරමුදල (2021.11.15 දින දක්වා)
10. වී. ලොකුනාරංගොඩ මහතා, සභාපති, තුරුසවිය අරමුදල (2021.11.15 දින සිට)
11. ප්‍රින්ස් ගුණසේකර මහතා,ප්‍රධාන විධායක නිලධාරී, කෑගල්ල/නමුනුකුල වැවිලි සමාගම (2021.11.15 දින සිට)

*නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ*

1. ජේ.එම්. මංගලතිස්ස මයා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (2021.04.21 දින දක්වා)
2. භාතිය බුළුමුල්ල මයා, සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය
3. මාධව වර්ණකුලසූරිය මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (2021.06.30 දින සිට)

*සහභාගී වූ වෙනත් නිළධාරීන්*

1. ආචාර්ය වී.එච්.එල්. රුද්‍රිගෝ මහතා, වැඩබලන අධ්‍යක්ෂ, ලංකා රබර් පර්යේෂණ ආයතනය (2021.12.30 දින සිට)
2. සුසන්ත දිසානායක මහතා, ජොෂ්ඨ පරිපාලන නිළධාරී, රබර් පර්යේෂණ ආයතනය

### ස්ථාවර කමිටුව

***වතු කමිටුව***

1. මහාචාර්ය සුධීරා එම්.ඩබ්. රන්වල මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

2. ආචාර්ය වී.එච්.එල්. රුද්‍රිගෝ මයා, වැඩබලන අධ්‍යක්ෂ, රබර් පර්යේෂණායතනය (2021.12.30 දින සිට)
3. ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව), රබර් පර්යේෂණායතනය
4. ආචාර්ය සුසන්ත සිරිවර්ධන මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණික), රබර් පර්යේෂණායතනය
5. නිස්සංක සෙනෙවිරත්න මයා, අධ්‍යක්ෂ, කොටගල වැවිලි සමාගම
6. ජගත් හෙට්ටිආරච්චි මයා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, අරප්පොලකන්ද වතුයාය
7. පී.ඒ. ලක්ෂ්මන් මයා, ජ්‍යෙෂ්ඨ වතු කළමනාකරු, රබර් පර්යේෂණායතනය
8. බී.එස්.එස්. හේවගේ මයා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය

***විගණන හා කළමනාකරණ කමිටුව***

1. දර්ශනී ද සිල්වා මිය, අධ්‍යක්ෂ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (කමිටු සභාපති)
2. කේ.වී.ඩී.සී. විමලසිරි මයා, අධ්‍යක්ෂ (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
3. ජේ.එම්. මංගලතිස්ස මයා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (2021.04.28 දින දක්වා)
4. මාධව වර්ණකුලසූරිය, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (2021.10.28 දින දක්වා)
5. සන්ධ්‍යා සමරසිංහ මිය, විගණන අධිකාරී, විගණකාධිපති දෙපාර්තමේන්තුව (2021.04.28 දින දක්වා)
6. කේ.ඒ.සී. ශාමන්ත මහතා, අභ්‍යන්තර විගණක, වැවිලි අමාත්‍යාංශය (2021.10.28 දින සිට

***සහභාගිත්වයෙන්***

1. ආචාර්ය වී.එච්.එල්. රුද්‍රිගෝ මයා, වැඩබලන අධ්‍යක්ෂ, රබර් පර්යේෂණායතනය (2021.12.30 දින සිට)
2. බී.එස්.එස්. හේවගේ මයා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය
3. එම්.එස්.අයි. සේනාධීර මිය, අභ්‍යන්තර විගණක, රබර් පර්යේෂණායතනය
4. සුසන්ත දිසානායක මයා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිළධාරී, රබර් පර්යේෂණායතනය

***විද්‍යාත්මක කමිටුව***

*ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ සාමාජිකයන්*

1. මහාචාර්ය සුයිරා එම්.ඩබ්. රංවල මහත්මිය, සභාපතිනි, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2. ආචාර්ය වී.එච්.එල්. රොද්‍රිගු මහතා, වැඩබලන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය (2021.12.30 දින සිට)
3. ආචාර්ය ජී.පී.ඩබ්ලිව්.පී. සෙනෙවිරත්න මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා), ර.ප.ආ.
4. ආචාර්ය එස්. සිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ), ර.ප.ආ.
5. ආචාර්ය ඩී.ජී. එදිරිසිංහ මිය, ප්‍රධානී, රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.

6. ආචාර්ය එස්.පී. විතානගේ මිය, ප්‍රධානි, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
7. ආචාර්ය බී.ඩබ්. විජේසූරිය මිය, ප්‍රධානි පර්යේෂණ නිලධාරී, ජෛවමිතික අංශය, ර.ප.ආ.
8. ආචාර්ය එන්.එම්.සී. නයනකාන්ත මහතා, ප්‍රධානී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
9. ආචාර්ය ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, ප්‍රධානී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
10. ආචාර්ය ඊ.එස්. මුණසිංහ මිය, පර්යේෂණ නිලධාරී, උපයෝගීතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ.
11. ආචාර්ය කේ.වී.වී.එස්. කුඩලිගම මිය, ප්‍රධානි, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
12. ආචාර්ය ආර්.පී. හෙට්ටිආරච්චි මිය, ප්‍රධානි, පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
13. ආචාර්ය ඒ.පී. අත්තනායක මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, දළ රබර් සහ රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
14. ආචාර්ය කේ.කේ. ලියනගේ මහතා,ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
15. ටී.යු.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
16. බී.එම්.ඩී.සී. බාලසූරිය මිය, පර්යේෂණ නිලධාරි, උපයෝගීතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ.
17. ඩී.එස්.ඒ. නාකන්දල මිය, පර්යේෂණ නිලධාරි, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
18. එම්.කේ.ආර්. සිල්වා මිය, පර්යේෂණ නිලධාරී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
19. ඩබ්.ඩී.එම්. සම්පත් මහතා, පර්යේෂණ නිලධාරී, රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
20. පී.කේ.කේ.එස්. ගුණරත්න මහතා, උපදේශක නිලධාරී, උපදේශක සේවා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
21. ජේ.කේ.එස්. සංකල්ප මහතා, පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
22. කේ. අධිකාරි මහතා, පර්යේෂණ නිලධාරී, දළ රබර් සහ රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
23. අයි.එච්.කේ. සමරසිංහ මිය, පර්යේෂණ නිලධාරී, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
24. ටී.ටී.ඩී. දහනායක මිය, පර්යේෂණ නිලධාරි, ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
25. එච්.ඒ. රුවනි ජයවර්ධන මිය, පර්යේෂණ නිලධාරි, පාංශු හා ශාක පෝෂක දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
26. එන්.පී. සුරනි කරුණාරත්න මිය, පර්යේෂණ නිලධාරි, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ
27. පී.ජී.එන්. ඉෂානි මිය, පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
28. යශෝධ සෝමරත්න මහතා, පර්යේෂණ නිලධාරී, බහු අවයවික දෙපාර්තමේන්තුව,

ර.ප.ආ.

29. ආලෝකා වීරසිංහ මිය, පර්යේෂණ නිලධාරී, රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
30. මංජුල අල්විස් මහතා, පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
31. සංගීත් ලියනආරච්චි මහතා, පර්යේෂණ නිලධාරී, පාංශු හා ශාක පෝෂක දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
32. දිල්හාන් රත්නායක මහතා, පර්යේෂණ නිලධාරී, ජෛවමිතික අංශය, ර.ප.ආ.
33. පී.ඒ. ලක්ෂ්මන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වතු), ර.ප.ආ.

***<u>රබර් කර්මාන්තය සහ අනෙකුත් ආයතන නියෝජනය කරන සාමාජිකයෝ</u>***

1. මනෝජ් උඩුගම්පොළ මහතා, ප්‍රධාන විධායක නිලධාරි, අගලවත්ත වැවිලි සමාගම, FLC Tower, නො 19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08
2. එස්. දිසානායක මහතා, සාමාන්‍යාධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, පඹේගම වතුයාය, පරකඩුව
3. කේ. ප්‍රනාන්දු මහතා, සහකාරි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, අගලවත්ත වැවිලි සමාගම, ක්ලොඩන් වතුයාය, නැබඩ
4. ඩී.පී.ඒ. පෙරේරා මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, තැ.පෙ 06, බලංගොඩ වැවිලි සමාගම, පාම්ගාර්ඩන්, රත්නපුර
5. ඩී.කේ. විජේරත්න මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, රඹුක්කන කන්ද වතුයාය, රත්නපුර
6. බී.එල්.එල්. ප්‍රේමතිලක මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, මහාවල වතුයාය, රත්නපුර
7. ඩී.කේ. විජේරත්න මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, රඹුක්කනකන්ද වතුයාය, රත්නපුර
8. ආර්.ඒ. අලහකෝන් මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, ගලතුර වතුයාය, කිරිඇල්ල
9. ආර්.එම්.ඩී.ටී.ජේ. රත්නායක මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, මිල්ලවිටිය වතුයාය, රත්නපුර
10. එස්.බී. රණවක මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, රාස්සගල වතුයාය, බලංගොඩ
11. ඩී.එල්.ඩී.එස් කන්දෙගම මහතා, අධිකාරි, බලංගොඩ වැවිලි සමාගම, රයිගම/විකිලිය වතුයාය, බලංගොඩ
12. බී. බුළුමුල්ල මහතා, ප්‍රධාන විධායක නිලධාරී, ඇල්පිටිය වැවිලි සමාගම, 09 වන මහල, එයිට්කන් ස්පෙන්ස් 1 කුළුණ, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
13. ඒ.ජී. ගීත් කුමාර මහතා, ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි, ඇල්පිටිය වැවිලි සමාගම, 09 වන මහල, එයිට්කන් ස්පෙන්ස් 1 කුළුණ, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
14. බී.එච්.යු බුළුගහපිටිය මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, තල්ගස්වල වතුයාය, තල්ගස්වල

15. කේ.අයි.සී. ඉසුරු මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, බෙන්තොට වතුයාය, ඇල්පිටිය
16. ආර්.බී.එස්. ඩග්ලස් මහතා, ජ්‍යෝෂ්ඨ කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ඇල්පිටිය වතුයාය, ඇල්පිටිය
17. එන්.ජේ දන්දෙණිය මහතා, අධිකාරි, ඇල්පිටිය වැවිලි සමාගම, කටෙන්දොල වතුයාය
18. කේ.එස්. ගුණරත්න මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ලෙල්වල වතුයාය, වඳුරඹ
19. එස්.ඒ. ඊරියගම මහතා, ප්‍රධාන විධායක නිලධාරි, කෑගල්ල වැවිලි සමාගම, 310 හයිලෙවල් පාර, නාවින්න, මහරගම
20. එස්.ඒ.ඒ.පී. ජයතිලක මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, පල්ලේගම වතුයාය, නියදුරුපොළ
21. බී.පී.එස්.එම් කුරේ මහතා, වතු අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම
22. එස්.ඩී. මුණසිංහ මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, ඉදැල්ල වතුයාය, පොල්ගහවෙල
23. බී.එම්.ජේ.ඒ. මුනමලේ මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, අටාලේ වතුයාය, අටාලේ
24. දූෂාන් රත්වත්තේ මහතා, ප්‍රධාන විධායක නිලධාරි, හපුගස්තැන්න වැවිලි සමාගම, තැ.පෙ. 2, නම්බපාන වතුයාය, ඉංගිරිය
25. ප්‍රියා ගුණවර්ධන මහතා, හපුගස්තැන්න වැවිලි සමාගම, තැ.පෙ. 2, නම්බපාන වතුයාය, ඉංගිරිය
26. රනිල් කපුගේකියන මහතා, සංවර්ධන නිලධාරි, හපුගස්තැන්න වැවිලි සමාගම, තැ.පෙ. 2, නම්බපාන වතුයාය, ඉංගිරිය
27. එච්. මැදිවක මහතා, අධිකාරි, හපුගස්තැන්න වැවිලි සමාගම, බිබිලේ වතුයාය, බිබිලේ
28. එම්. කාරියප්පෙරුම මහතා, අධ්‍යක්ෂ, හොරණ වැවිලි සමාගම, නො. 400, ඩීන්ස් පාර, කොළඹ 10
29. සජිත් ගුණවර්ධන මහතා, කළමණාකරු, හොරණ වැවිලි සමාගම, ප්‍රොසෙස්ටර් වතුයාය, ගෝවින්න
30. කේ.ඩී.එල්.ඩී. සංජීව මහතා, කළමණාකරු, හොරණ වැවිලි සමාගම, නිව්චැටල් වතුයාය, නෑබඩ
31. එන් විජේනායක මහතා, හොරණ වැවිලි සමාගම, හල්වතුර වතුයාය, ඉංගිරිය
32. එන්.බී. සෙනෙවිරත්න මහතා, අධ්‍යක්ෂ, පහතරට, කොටගල වැවිලි සමාගම, ප්‍රාදේශීය කාර්යාලය, කොළඹ 01
33. එම්.එස් මඩුගල්ල මහතා, ප්‍රධාන විධායක නිලධාරි, කොටගල වැවිලි සමාගම, ප්‍රාදේශිය කාර්යාලය, කොළඹ 01

34. ජේ.එන්. හෙට්ටිආරච්චි මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, අරප්පල කන්ද වතුයාය, තෙබුවන
35. බුද්ධික විරකෝන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ඩෙල්කිත් වතුයාය, බදුරලිය
36. එල්.ඒ.ඩී.ජේ. පෙරේරා මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, උස්ක්වැලි වතුයාය
37. ආර්. තෙන්නකෝන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, කොටගල වැවිලි සමාගම, පාදුක්ක වතුයාය, පාදුක්ක
38. ජී.එල්.ටී.එස්. ස්වර්ජිත් මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ගීකියනකන්ද වතුයාය, නෑබඩ
39. ඒ.එම්.ඒ.ආර්. අබේසිංහ මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, පයියාගල වතුයාය, දොඩන්ගොඩ
40. යු. අමරසේකර මහතා, නියෝජ්‍ය කළමණාකරු, කොටගල වැවිලි සමාගම, වෝගන් වතුයාය, මතුගම
41. එන්. විජේරත්න මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, ඇඳුරගල වතුයාය, ඉංගිරිය
42. යු.කේ. ප්‍රනාන්දු මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, රයිගම් වතුයාය, ඉංගිරිය
43. සී. අමරතුංග මහතා, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි, කහවත්ත වැවිලි සමාගම, ප්‍රාදේශීය කාර්යාලය, පැල්මඩුල්ල වතුයාය, කහවත්ත
44. ටී.වී. ජයසේකර මහතා, කෘෂිවිද්‍යාඥ, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, කහවත්ත වැවිලි සමාගම, ගොඩැල්ල වත්ත වතුයාය, සන්නස්ගම, ලෙල්ලොපිටිය
45. ජීවන්ත සේනාරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, රිල්හේන වතුයාය, පැල්මඩුල්ල
46. එස්. හේවාගම මහතා, නියෝජ්‍ය කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, හුණුවල වතුයාය, ඕපනායක
47. වජිර හේවගේ මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, ඕපාත වතුයාය, කහවත්ත
48. එල්. පෙරේරා මහතා, කහවත්ත වැවිලි සමාගම, පැල්මඩුල්ල වතුයාය, කහවත්ත
49. කේ.වී.අයි. ප්‍රභාත් මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, හවුපෙ වතුයාය, කහවත්ත
50. ඉන්ද්‍රජිත් රුක්මාල් මහතා, කළමනාකරු, කහවත්ත වැවිලි සමාගම, අකරැල්ල වතුයාය, ඕපනායක
51. චානක ගුණතිලක මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, පෝරණුව වතුයාය, කහවත්ත
52. වජිර හේවගේ මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, ඕපාත වතුයාය, කහවත්ත

53. යජිත් ද සිල්වා මහතා, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි, කහවත්ත වැවිලි සමාගම, ගොඩැල්ලවත්ත, සන්නස්ගම, කහවත්ත
